# රන් අස්වනු

රටක කෘෂිකර්මාන්තයේ අනාගතය රඳාපවතින එක් සාධකයක් ලෙස සාර්ථක බෝග ප්‍රභේද නිෂ්පාදනය සඳහන් කළ හැකිය. ඉහළ අස්වනු ලබා දෙන, රෝග පළිබෝධ හානි වලට ඔරොත්තු දෙන අහිතකර පරිසර තත්ත්වයන්ට ඔරොත්තු දෙන බෝග ප්‍රභේදයක් නිපදවීමේ කාර්යය සුළුපටු කටයුත්තක් නොවේ. එය වසර ගණනක සිදුකරන ලද පර්යේෂණ වල ප්‍රතිඵලයකි. වසර ගණනාවක් කරන ලද අත්හදා බැලීමේ ප්‍රතිඵලය හොඳ හෝ නරක විය හැකිය. කෙසේ වෙතත් නිපදවන ලද නව ප්‍රභේදයක් ගොවීන් අතර ජනප්‍රිය නොවුවහොත් එම ප්‍රභේදය භාවිතයෙන් ඉවත් වේ. කෙසේ නමුත් සාර්ථක බෝග ප්‍රභේදයක වටිනාකම මුදලින් තක්සේරු කළ නොහැක. එවන් ප්‍රභේදයක් නිපදවා සංවර්ධනය කිරීමට දායකවන කෘෂි විද්‍යාඥයින් නොමදව උපහාරයට ලක්විය යුතුය.

2017 වසරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙරට වගාව සඳහා නිර්දේශ කරන ලද බෝග ප්‍රභේද රැසක තොරතුරු මෙවර ගොවිකම් සඟරාවෙන් මෙලෙස දිග හැරේ.





## අඹ

### හොරණ හිරු

හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් වරණය කරන ලද මෙම අඹ ප්‍රභේදය අපේ රටේ පහත රට තෙත් කලාපය සඳහා නිර්දේශ කර ඇත. මෙම අඹ ප්‍රභේදය වේගවත් වර්ධන විලාසයක් පෙන්වන අතර ක්‍රමවත් වාර්ෂික පුෂ්පීකරණයක් ඇත. ඇන්ත්‍රැක්නෝස් රෝගයට මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාවයක් දක්වයි. උසස් කල් තබාගැනීමේ හැකියාවක් මෙම ඵල වලට ඇත. ඵලය මේරුණු විට කහ පැහැයෙන් යුක්තය. පළිබෝධ හානි අවම කර ගැනීමටත් ඵල වල කහ පැහැය ඇතිකර ගැනීමටත් ඵල ආවරණය කිරීම අත්‍යවශ්‍ය වේ.





# වැල්දොඩම් හොරණ ගෝල්ඩ්

හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් නිපදවන ලද මෙම වැල්දොඩම් ප්‍රභේදය අපේ රටේ පහත රට තෙත්, අතරමැදි හා වියළි කලාපයේත් මැදරට තෙත්, අතරමැදි කලාපයේත් වියළි කලාපයේත් වගා කිරීමට සුදුසු වේ. ඉහළ අස්වැන්නක් ලබා දේ. ගෙඩියක සාමාන්‍ය බර ග්‍රෑම් 155 ක් පමණ වේ. මදය කහ පැහැයට හුරු තැඹිලි පැහැයක් ගනී. ඉදුණු විට පොත්තේ වර්ණය කහ තැඹිලි පැහැයෙන් යුක්තය. රවුම් හෝ දිගටි හැඩයේ ඵල දරයි. පැළ නිෂ්පාදනය බීජ මඟින් සිදු කරයි.



# වැල් දොඩම් බණ්ඩාරවෙල දම්

බණ්ඩාරවෙල ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් නිෂ්පාදනය කොට ඇත. උඩරට අතර මැදි හා උඩරට තෙත් කලාපයන් සඳහා නිර්දේශ කර ඇත. ගෙඩිවල පොත්ත රතු පැහැයට හුරු දම් පැහැයක් ගනී. ගෙඩිවල හා පහුරුවල දම් පැහැති වර්ණය වැඩිපුර දක්නට ඇත. කඳ මැද සිදුරක් නොමැත. ගෙඩියක බර ග්‍රෑම් 100 - 120 ත් අතර වේ. යුෂය කහ පැහැ වන අතර බ්‍රික්ස් අගය 17 ක් වේ. වෛරස් හා මුල් කුණුවීමේ රෝගයන්ට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධී වේ. පැළ සිටුවා මාස 10 කින් පමණ පළමු අස්වැන්න ලබා ගත හැකිය. පළමු වසර තුළදී වැලකින් කිලෝග්‍රෑම් 16 ක් දෙවන වසර තුළදී වැලකින් කිලෝග්‍රෑම් 24ක අස්වැන්නක් ද ලබා ගත හැකිය.





## නාරං
### ජූසි

හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් නිපදවන ලද මෙම ප්‍රභේදය අපේ රටේ පහත රට කලාපයේ වගාව සඳහා නිර්දේශ කර ඇත. නැවුම් පලතුරක් සඳහා හා යුෂ නිෂ්පාදනයට මෙම වර්ගය යොදාගත හැකිය. ප්‍රධාන අස්වනු වාර දෙකක් ඇත. වසර පුරා පැතිරුණු අස්වැන්නක් ලබාදේ. එක් ගසක් වසරකට කිලෝග්‍රෑම් 60 ක පමණ අස්වැන්නක් ලබාදේ. ග්‍රෑම් 100 - 130 අතර බර විශාල ඵල දරයි. මදය තැඹිලි පැහැයක් ගනී.





## නෙල්ලි
### ගන්නොරුව නෙල්ලි

නාගරික ගෙවතු වල බඳුන් වගාව සඳහා සාර්ථකව යොදා ගත හැකි මෙම නෙල්ලි ප්‍රභේදය ගන්නොරුව පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය විසින් වරණය කරන ලද්දකි. පැළ සිටුවා වසර 2 $^{1}/_{2}$ - 3 ක් අතරදී මල් පිපී ගෙඩි හට ගනී. මේරූ ගෙඩි කහ පැහැයට හුරු කොළ පැහැයකින් යුක්ත වේ. ගෙඩි විශාල වන අතර ගෙඩියක් ග්‍රෑම් 40 - 70 අතර බරකින් යුක්ත වේ. වසරකට එක් ගසකින් කිලෝග්‍රෑම් 150 ක තරම් සාපේක්ෂව වැඩි අස්වැන්නක් ලබා දේ.





## මාදන්
### ගන්නොරුව මාදන්

බඳුන් වගාව සඳහා සාර්ථකව යොදා ගත හැකි මෙම මාදන් ප්‍රභේදය ගන්නොරුව පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් සොයාගෙන ඇත. තෙත් කලාපය සඳහා නිර්දේශ කර ඇත. දේශීය දම් ප්‍රභේදය හා සැලකීමේදී විශාල ඵල දරයි. ග්‍රෑම් 13ක් පමණ බර ඵල දරයි. මාංශලය දම් පැහැතිය. එය යුෂ පිරුණු හා රසවත් වේ. ඉදුණු ඵලය දම් පැහැති කළු වර්ණයක් ගනී.





## මාදන්
### ගන්නොරුව ඵල දන්

කලාතුරකින් දක්නට ලැබෙන සුවිශේෂී මාදන් වර්ගයකි. එය ඵල දං ලෙස ජනයා අතර ප්‍රචලිතය. මෙම මාදන් ප්‍රභේදය ගන්නොරුව පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ස්ථානය විසින් සොයාගෙන ඇත. පැසුණු විට ලා කොළ පැහැයෙන් යුක්තය. මාංශලයේ යුෂ පිරී ඇත. බඳුන් වගාව සඳහා යොදාගත හැකිය.





# දෙළුම්

## කල්පිටිය දෙමුහුම්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කරන ලද ප්‍රථම දෙමුහුම් දෙළුම් ප්‍රභේදයයි. මෙම ප්‍රභේදය ආනයනික දෙළුම් ප්‍රභේද හා තරඟ කළ හැකි ප්‍රභේදයකි. ඵලයේ මදුලු රත් පැහැයක් ගනී. මෘදු බීජ සහිතය. ගෙඩිය රවුම් වන අතර මධ්‍යම ප්‍රමාණයෙන් යුක්තය. තැඹිලි රෝස පැහැයක් ගන්නා ඵල ආවරණය තුනීය. වසර 5 ක් පමණ වයස ගසක හටගන්නා ගෙඩියක බර ග්‍රෑම් 230 - 260 ක් පමණ වේ. කිලෝග්‍රෑමයකට ගෙඩි 4 - 5 ක් අල්ලයි. ඉතා මිහිරි රසයකින් යුතු පල්පය තද රතු පැහැතිය. බ්‍රික්ස් අගය 15 - 16 ක් වේ. දැනට නිර්දේශ කර ඇති හා ආනයනික දෙළුම් ප්‍රභේද වලට වඩා වැඩි ප්‍රතිඔක්සිකාරක ගුණයකින් යුක්තය.





# කව්පි

## ANKCP 2

අඟුණකොළපැලැස්ස මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් නිපදවා ඇත. කව්පි වගා කරන සියළුම ප්‍රදේශ සඳහා මෙම ප්‍රභේදය නිර්දේශ කර ඇත. බීජ සිටුවා අස්වනු නෙළීමට දින 64 - 68 ක් ගතවේ. හෙක්ටයාරයකින් කිලෝග්‍රෑම් 1500 - 1600 ක පමණ සාමාන්‍ය අස්වැන්නක් ලබා ගත හැකිය. බීජ ලා දුඹුරු සුදු පැහැයක් ගනී. අස්වනු වාර 3, 4 කින් සම්පූර්ණ අස්වැන්න නෙලා ගත හැකිය. ගොවීන් අතර දැනට ජනප්‍රිය කඩල කව්පි ස්වරූපය ගැනීම නිසා පැසුණු හා අමු කරල් බිජ වෙන් කර ව්‍යංජනයක් ලෙසද ආහාරයට ගැනීමට හැකි අතර අමු කරල් අලෙවි කිරීමේ හැකියාව ඇත. එමෙන්ම වියළි බීජ තම්බා ආහාරයට ගත හැකිය. බීජ ප්‍රමාණයෙන් විශාල නිසා හා පැහැය නිසා පාරිභෝගික රුචිකත්වය වැඩිය.





## මිරිස්

### MICH HY 2

මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් නිපදවන ලද දෙවැනි දෙමුහුම් මිරිස් ප්‍රභේදයයි. මෙම ප්‍රභේදයෙන් හෙක්ටයාරයකට මෙට්‍රික්ටොන් 35 ක විභව අස්වැන්නක් ලබාගත හැකිය. මේ දක්වා නිදහස් කර ඇති විවෘත පරාගික මිරිස් ප්‍රභේද වලට වඩා මෙම ප්‍රභේදයෙන් සියයට 30 - 40 ක වැඩි අස්වැන්නක් ලබාගත හැකිය. මිරිස් වගාවේ ප්‍රධානතම ගැටළුවක් වන කොළ කොඩවීමේ රෝගයට මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවයක් දක්වයි. මේ නිසා මිරිස් වගාව සඳහා භාවිතා කරන රසායනික පළිබෝධනාශක ප්‍රමාණය අවම කරගත හැකිය. ශාකයේ උස සෙන්ටිමීටර 75 ක් පමණ වන අතර අධික අතු බෙදීමක් පෙන්වයි. අමුමිරිස් ලෙස මෙන්ම වියළි මිරිස් නිෂ්පාදනයට ද යෝග්‍ය වේ.



## බෝංචි

### PB 161 (කැකුළු බෝංචි)

මෙම ප්‍රභේදය හෙක්ටයාරයකට මෙට්‍රික්ටොන් 23 - 25 අතර විභව අස්වැන්නක් ලබා දේ. බීජ සිටුවා දින 40 - 45 කින් මල් හටගන්නා අතර දින 60 - 63 දී අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය. කොළ පැහැති මධ්‍යස්ථ දිගකින් යුත් රවුම් කරල් හටගනී. කරල මතුපිට සිනිඳු අතර බීජ බේරී පෙනීම ඉතා අඩුය. වැල පුරාම ඒකාකාරීව කරල් හටගනී. අස්වනු වාර 8 - 9 ක් ලබා ගත හැකිය. අස්වනු නෙළීමට ප්‍රමාද වුවත් කරලේ ළපටි ස්වභාවය රැඳී පවතී.

**ස්තූතිය : ආචාර්ය ශිරෝමණී රාජපක්ෂ**

**අතිරේක අධ්‍යක්ෂ පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ**
**සභාපති බෝග ප්‍රභේද නිර්දේශ කිරීමේ කමිටුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

# රන්දියවර මංගල්‍යය



පුලතිසි දිසාවේ පරසිඳු මින්නේරි
ගිරිතලේ කවුඩුල්ල කන්තලේ බලන් සිරි
වැව් සිය ගණන් පෝෂණ ගුණයෙන් සපිරි
ජල කඳ ගලා යයි බාධක මැද සුපිරි

අනුරපුරේ හා පුලතිසි පුරය
මාතලේ හා තිරිකුණා මළය
වයඹ දිසාවේ ඇතුගල් පුරය
ප්‍රතිපෝෂණය වේ ලැබුමෙන් ජලය

ආර්ථිකයට කණකොකා හැඬුවා
ලෙඩ රෝග උත්සන්න වුවා
කඳුළු කතාවල නිමක් නැති වුවා
ලැබෙන තුරු විසඳුමක් පෙරුම් දම් පිරුවා

උන්හිටි තැනුත් නැති කර වූ ගංවතුර
වකුගඩු රෝග පීඩාදිය නිරන්තර
ආරක්ෂා කරයි පිරිසිදු ජලයෙන් නිතර
ලැබදෙයි විසඳුමක් ජනතා තිර සාර

මොරගහකන්ද කළුගඟ ජල කඳ ගැලූවා
ගම් දනව් මහනගර මාවත් බිහි වූවා
අවතැන් පවුල් නැවතත් ස්ථාපිත කෙරුවා
යටිතල පහසුකම් නොඅඩුව සැප යූවා

වැඩි දායකත්වය දුන් කෘෂි වගා වට
මිරිදිය මත්ස්‍යද මිලියන වටිනා කමට
විදුලි බලය උත්පාදන පිරි වැයට
ප්‍රතිඵල ලබා දෙයි දුප්පත් ජන යාට

මනම්පිටියත් සෝමවතියත් ගලන ජලයට යට වුනා
මිනිස් ජීවිත වගා බිම් හා සතා සිවුපා වැන සුනා
මෙල්ල කර ගනු නොරිසි මහා ජල කඳක් ගැලූවා
එවන් වූ ඔබ රන්දියවරක් සේ අද පිදුම් ලැබුවා

**මොරගහකන්ද ව්‍යාපාරය ගැන**
**ගොවිකම් සඟරාව රසවත් කළේ,**

**නන්දනී ශාන්තිලතා - රාජ්‍ය කලමනාකරණ සහකාර**
**කෘෂි ප්‍රකාශන ඒකකය, ගන්නෝරුව**